" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / பொதுத் தொலைபேசி / General Telephone - 011 - 2093000

ISO 9001 · SLAB ACCREDITED · ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/ADM/18-38/FI/03 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No | දිනය / திகதி / Date 2023.03.04/03

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මුල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරී,

**<u>රාජකාරි විදේශ ගමන් සඳහා විනිමය මුදා හැරීම හා ඒ ආශ්‍රිත වියදම්.</u>**

උක්ත මැයෙන් ජනාධිපති ලේකම්ගේ අංක පීඑස්/සීඑස්ජ්/00/1/4/8 හා 2023.03.15 දිනැතිව නිකුත් කරන ලද චක්‍රලේඛ ලිපියේ පිටපතක් ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කරන බව දන්වා සිටිමි.

02. එකී චක්‍රලේඛය පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානීන් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

එස්.එම්.එච්.කුසුම්සිරි,
පරිපාලන නිලධාරී (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/4/8

2023 මාර්තු මස 15 වන දින

ලේකම්
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

රාජකාරි විදේශ ගමන් සඳහා විනිමය මුදා හැරීම හා ඒ ආශ්‍රිත වියදම්

උක්ත කරුණ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ ලේකම් සහ භාණ්ඩාගාරයේ ලේකම් විසින් නිකුත් කරන ලද 2015 මැයි මස 15 වන දිනැති අංක : මු.අ. 01/2015/01 දරන චක්‍රලේඛය හා බැඳේ.

02. වර්තමානයේ රටේ පවත්නා ආර්ථික හා මූල්‍ය දුෂ්කරතා මත රජයේ අරමුදල් අත්‍යවශ්‍ය කාර්යයන් සඳහා පමණක් ඉතා අරපිරිමැස්මෙන් යුතුව භාවිතා කළ යුතු බැවින්, නිල දූත කාර්යයන් හා රාජකාරි, සාකච්ඡා, සම්මන්ත්‍රණ, පුහුණු වැඩසටහන් ඇතුළුව සියළුම රාජකාරි කටයුතු සඳහා විදේශගත වීමේදී ගෙවනු ලබන දීමනා සීමා කිරීමට ගරු ජනාධිපතිතුමා තීරණය කර ඇත.

03. ඒ අනුව, 2023 මාර්තු මස 20 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි උක්ත චක්‍රලේඛයෙහි සඳහන් මතු දැක්වෙන විධිවිධාන පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට ගරු ජනාධිපතිතුමා විසින් නියම කර ඇති බව කාරුණිකව දන්වමි.

(I) 03 ඡේදය - අනියම් දීමනා ගෙවීම

- 03 (අ) උප ඡේදයෙහි සඳහන් අනියම් වියදම් පියවා ගැනීම සඳහා එක් දිනකට ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 25 ක් බැගින් උපරිම දින 15 ක් දක්වා අනියම් දීමනාව ගෙවිය යුතුය.
- 03 (ආ) උප ඡේදයෙහි සඳහන් අනියම් වියදම් පියවා ගැනීම සඳහා එක් දිනකට ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 40 ක් බැගින් උපරිම දින 10 ක් දක්වා අනියම් දීමනාව ගෙවිය යුතුය.

(II) 04 ඡේදය - සංයුක්ත දීමනා ගෙවීම

- 04 (අ) උප ඡේදයෙහි දැක්වෙන වගුවෙහි දෙවන හා තුන්වන තීරුවල සඳහන් ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් වලින් ගෙවනු ලබන දීමනා 30% කින් අඩු කර ගෙවිය යුතුය.
- 04 (ඉ) උප ඡේදයෙහි සඳහන් ශිෂ්‍යත්වයක් සඳහා විදේශ රජයන් හෝ ප්‍රදායක ආයතනයන් විසින් අනියම් දීමනා නොගෙවන අවස්ථාවලදී, විදේශගත වන නිලධාරියෙකුට අනියම් වියදම් පියවා ගැනීම සඳහා එක් දිනකට ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 25 ක් බැගින් උපරිම දින 10 ක් දක්වා අනියම් දීමනාව ගෙවිය යුතුය.

(III) 05 ඡේදය - සංග්‍රහ දීමනාව

නිල චාරිකාවක දී දූත පිරිසට නායකත්වය දෙන අමාත්‍යවරයාට හෝ අමාත්‍යාංශ ලේකම්වරයාට එම නිල චාරිකාවේ දී සංග්‍රහ වියදම් දැරීමට සිදු වන්නේ නම්, අදාළ රටෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 750 ක මුදල් ප්‍රතිපාදන ලබා දිය හැකි අතර, අදාළ රටෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයක් නොමැති නම්, ගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරනු ලබන නිල දූත පිරිසෙහි නායකත්වය දරන අමාත්‍යවරයාට හෝ ලේකම්වරයාට ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 750 ක් සඳහා වූ මුදලක් සංග්‍රහ දීමනා වශයෙන් ගෙවිය හැකිය.

Galle Face, Colombo 01
Telephones ++ 94 (0) 11 2354418
++ 94 (0) 11 2473873
Fax ++ 94 11 2446657
e-mail psec@presidentsoffice.lk

Scanned with CamScanner

04. තවද, ප්‍රදායක ආයතනය විසින් පූර්ණ පිරිවැය දරනු නොලබන විදේශ අධ්‍යයන / පුහුණු / සාකච්ඡා / සම්මන්ත්‍රණ / සංචාර සඳහා දේශීය අරමුදල් මගින් වියදම් දරමින් රජයේ නිලධාරීන් සහභාගී නොකළ යුතුය.

05. ඉහත 03 සහ 04 ඡේදයන්හි සඳහන් විධිවිධානවලට අදාළව මීට පෙර නිකුත් කර ඇති චක්‍රලේඛ හෝ උපදෙස් ලිපිවල සඳහන් විධිවිධාන 2023 මාර්තු මස 20 වැනි දින සිට බලරහිත වන බව වැඩිදුරටත් දන්වා සිටිමි.

ඊ එම් එස් බී ඒකනායක
ජනාධිපති ලේකම්

පිටපත් :

| | | | |
|---|---|---|---|
| 1 | අග්‍රාමාත්‍ය ලේකම් | - | කරු. අවශ්‍ය කටයුතු සඳහා |
| 2 | අමාත්‍ය මණ්ඩලයේ ලේකම් | - | කරු. අවශ්‍ය කටයුතු සඳහා |
| 3 | සියළුම අමාත්‍යාංශ ලේකම්වරු | - | කරු. ඉහත විධිවිධාන අනුව කටයුතු කරන ලෙස ඔබ අමාත්‍යාංශය / ආයතනය යටතේ ඇති සියළුම දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන සහ අනෙකුත් ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීම සඳහා |
| 4 | සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් | - | කරු. ඉහත විධිවිධාන අනුව කටයුතු කරන ලෙස ඔබ පළාත් සභාව යටතේ ඇති සියළුම පළාත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන සහ අනෙකුත් ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීම සඳහා |
| 5 | පාර්ලිමේන්තු මහලේකම් | - | කරු. අවශ්‍ය කටයුතු සඳහා |
| 6 | විගණකාධිපති | - | කරු. අවශ්‍ය කටයුතු සඳහා |

Scanned with CamScanner

# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01, Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: මු/6/1/1/2015
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2015. 05. 15

චක්‍රලේඛ අංක: මු.අ. 01/2015/01

සියළුම අමාත්‍යංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන්, කොමිෂන් සභා සභාපතිවරු,
පළාත් පාලන ආයතන ප්‍රධානීන්,
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්,
ශ්‍රී ලංකා මහ බැංකුව ඇතුළුව සියළුම රාජ්‍ය බැංකු ප්‍රධානීන්,
විශ්වවිද්‍යාල උපකුලපතිවරු, උසස් අධ්‍යාපන ආයතන ප්‍රධානීන්,
රාජ්‍ය සමාගම්වල සභාපතිවරුන්.

**රාජකාරී විදේශ ගමන් සඳහා විනිමය මුදහැරීම හා ඒ ආශ්‍රිත වියදම්**

සාකච්ඡා, සම්මන්ත්‍රණ, පුහුණු වැඩසටහන් ඇතුළුව සියළුම රාජකාරී කටයුතු සඳහා විදේශගත වන නිලධාරීන්ට ගෙවිය යුතු දීමනා සම්බන්ධ විධිවිධාන ඇතුලත් කරමින් මෙම චක්‍රලේඛ උපදෙස් නිකුත් කෙරේ.

**02. සාමාන්‍ය කරුණු**

(අ) විදේශ ගමන් දීමනා හා ඒ ආශ්‍රිත වියදම් ලබා ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව විධිමත් පරිදි රාජකාරී නිවාඩු අනුමත කර තිබිය යුතු ය.

(ආ) විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති/වැඩසටහන් යටතේ විදේශගත වන්නේ නම් ඊට අදාළ ගිවිසුම්/ලේඛන වල ඒ සඳහා ප්‍රතිපාදන සැලසී තිබිය යුතු ය.

(ඇ) ශ්‍රී ලංකා ජනරජය නියෝජනය කරන නිල දූත කණ්ඩායමට ඇතුළත් විය යුත්තේ එම කාර්යය සඳහා අවශ්‍ය අවම නිලධාරීන් සංඛ්‍යාව පමණි.

(ඈ) මෙම චක්‍රලේඛයෙහි සඳහන් දීමනා ගෙවනු ලබන්නේ අදාළ තැනැත්තා පද්ධාවයෙන් යුක්තව එම මුදල් වියදම් කරනු ලබන්නේය යන නිගමනය පෙරදැරි කරගෙන ය. එබැවින් හිමිකම් නොලබන ගෙවීමක් ලැබී ඇත්නම් ගෙවීම් ලබන්නා විසින් එය ආපසු ගෙවීම ඔහුගේ/ඇයගේ වගකීම වේ.

03. අනියම් දීමනා ගෙවීම

(අ) අධ්‍යයනය, පුහුණුව, සාකච්ඡා, සම්මන්ත්‍රණ වැනි නිලධාරියකුගේ සුදුසුකම්, දැනුම හා කුසලතා සංවර්ධනයට අදාළ වැඩසටහන් සඳහා විදේශගතවීමේදී අනියම් දීමනා ගෙවීම.

මෙවැනි වැඩසටහනකට නිලධාරියකු විදේශගත වන විට, විදේශ රජය හෝ ප්‍රදායක ආයතනය විසින් එතෙරදී දරනු ලබන ගමන් වියදම්, ගුවන් තොටුපළ ගාස්තු, දුරකථන වියදම් වැනි අනියම වියදම් පියවා ගැනීම සඳහා අනියම් දීමනා ලෙස කිසියම් මුදලක් නොගෙවන විටෙකදී එක් දිනකට ඇ.එ.ජ.ඩොලර් 40 ක් බැගින් උපරිම දින 30 ක් සඳහා අනියම් දීමනා ගෙවිය හැකි ය.

(ආ) නිල දූත කාර්යයන් හෝ දිවයින තුළ ඉටුකළ නොහැකි ආයතනයේ විෂය පථයට අදාළ රාජකාරි කටයුත්තක් හෝ කාර්යයන් සඳහා රජය නියෝජනය කරමින් විදේශගතවීමේදී අනියම් දීමනා ගෙවීම.

මෙම රාජකාරි කටයුතු සඳහා සහභාගිවීමේදී, විදේශ රජය හෝ ප්‍රදායක ආයතනය විසින් එතෙරදී දරනු ලබන ගමන් වියදම්, ගුවන් තොටුපළ ගාස්තු, දුරකථන වියදම් යනාදිය පියවා ගැනීම සඳහා අනියම් දීමනා ලෙස කිසියම් මුදලක් නොගෙවන විටෙකදී එක් දිනකට ඇ.එ.ජ.ඩොලර් 75 ක් බැගින් උපරිම දින 15 ක් සඳහා අනියම් දීමනා ගෙවිය හැකි ය.

04. සංයුක්ත දීමනා ගෙවීම

(අ) ඉහත 03 (අ) සහ (ආ) අවස්ථාවන්හිදී නවාතැන් හා ආහාර පාන සඳහා වූ වියදම් විදේශ රජය හෝ ප්‍රදායක ආයතනය විසින් නොදරනු ලබන විට පමණක් පහත වගුවේ පරිදි සංයුක්ත දීමනා ගෙවිය හැකි ය.

සංයුක්ත දීමනාව - පැය 24 ක පූර්ණ දිනයක් සඳහා ඇමරිකානු එක්සත් ජනපද ඩොලර්වලින්

| රටවල් කාණ්ඩ අංක (උපලේඛන අංක 01 අනුව) | පළමුවන ගණය ඇ.එ.ජ. ඩොලර් | දෙවන ගණය ඇ.එ.ජ. ඩොලර් |
|---|---|---|
| 1 | 200 | 170 |
| 2 | 260 | 230 |
| 3 | 330 | 280 |
| 4 | 400 | 340 |
| 5 | 530 | 420 |

(1) ඉහත වගුවෙහි පළමුවන ගණයට අයත් වනුයේ,

(i) අමාත්‍යවරුන්, පළාත් ආණ්ඩුකාරවරුන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්/පළාත් සභා අමාත්‍යවරුන් සහ සභාපතිවරුන්/මහ නගර සභා පුරපතිවරුන් සහ නගර සභා හා ප්‍රාදේශීය සභා සභාපතිවරුන්,

(ii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6-2006 අනුව ආරම්භක මාසික වැටුප රු. 36,755/- හෝ ඊට ඉහළ වැටුප් පරිමාණයක් හිමි රජයේ නිලධාරීන්

(iii) ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිසුරුවරුන්, කොමිෂන් සභා සභාපතිවරුන්, විදේශ සේවයේ විදේශ දූත මණ්ඩල ප්‍රධානීන්, ජනාධිපති උපදේශකවරුන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති, නියෝජ්‍ය අධිපති, සහකාර අධිපති, රාජ්‍ය බැංකු සභාපතිවරුන්, මහා කලමනාකරුවන් හා ප්‍රධාන විධායක නිලධාරීන්, විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල හා රාජ්‍ය සමාගම්වල සභාපතිවරුන් හා ප්‍රධාන විධායක නිලධාරීන්

(2) ඉහත 4 (අ) (1) හි සඳහන් තැනැත්තන් හැර සෙසු සියළු තැනැත්තන් දෙවන ගණයට අයත් වේ.

(ආ) අධ්‍යයන හෝ රාජකාරී විදේශ ගමන් සම්බන්ධව විදේශ රජය හෝ ප්‍රදායක ආයතනය විසින් සංයුක්ත දීමනාවලින් කොටසක් (නවාතැන් සපයා ගැනීම සඳහා හෝ ආහාර පාන සඳහා හෝ පමණක්) ගෙවන අවස්ථාවලදී;

(1) විදේශ රජය හෝ ප්‍රදායක ආයතනය විසින් නවාතැන් සඳහා පමණක් පහසුකම් සපයන අවස්ථාවලදී ආහාර පාන සඳහා ඉහත 4 (අ) හි සඳහන් සංයුක්ත දීමනාවෙන් 35% ක් ගෙවීම් කළ හැකි ය.

(2) විදේශ රජය හෝ ප්‍රදායක ආයතනය විසින් ආහාර පාන සඳහා පමණක් පහසුකම් සපයන අවස්ථාවලදී නවාතැන් සපයා ගැනීම සඳහා ඉහත 4 (අ) හි සඳහන් සංයුක්ත දීමනාවෙන් 65%ක් ගෙවීම් කළ හැකි ය.

(ඇ) දිවයිනෙන් පිටත්වූ වේලාවේ සිට නැවත දිවයිනට පැමිණි වේලාව දක්වා පූර්ණ දින ගණන අනුව දීමනා ගණනය කළ යුතු ය. පැය 12 කට නොඅඩු ඉතිරි කාලයක් වේ නම් එය පූර්ණ දිනයක් සේ සැලකිය යුතු ය.

(ඈ) ඉහත 03 (අ) යටතේ සඳහන් පරිදි අධ්‍යයනය, පුහුණුව, සාකච්ඡා, සම්මන්ත්‍රණ වැනි වැඩසටහන් සඳහා විදේශගත වන කාල සීමාව දින 30 ඉක්මවන අවස්ථාවකදී හෝ/හා ඉහත 03 (ආ) යටතේ සඳහන් පරිදි රජය නියෝජනය කරමින් රාජකාරී සඳහා විදේශගත වන කාල සීමාව දින 15 ඉක්මවන අවස්ථාවකදී සංයුක්ත දීමනා ගෙවීම සඳහා භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු ය.

(ඉ) විදේශ රජයන් හෝ ප්‍රදායක ආයතනයන් විසින්, සියළුම වියදම් ආවරණය කරමින් පිරිනමනු ලබන පූර්ණ කාලීන ශිෂ්‍යත්ව වැඩසටහන් සඳහා නිලධාරියෙකු විදේශගතවීමේදී හා ජනාධිපති අරමුදල, පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනය (විශේෂඥ ශ්‍රේණි සඳහා වෛද්‍යවරු පුහුණු කිරීම සඳහා) සහ පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලය මගින් පිරිනමනු ලබන පූර්ණ කාලීන ශිෂ්‍යත්ව වැඩසටහන් සඳහා විදේශගතවීමේදී සංයුක්ත දීමනා නොගෙවිය යුතු ය. කෙසේ වුවද මෙවැනි ශිෂ්‍යත්වයක් සඳහා විදේශ රජයන් හෝ ප්‍රදායක ආයතනයන් විසින් අනියම් දීමනා නොගෙවන අවස්ථාවලදී විදේශ ගතවන නිලධාරියෙකුට එක් දිනකට ඇ.එ.ජ. ඩොලර් 40 ක් බැගින් උපරිම දින 15 ක් සඳහා අනියම් දීමනා ගෙවිය හැකි ය.

(ඊ) විදේශගත වීමට පෙර නියමිත දීමනා ලබා ගැනීමට නොහැකි වුවහොත් එම දීමනා විදේශගත වූ දින පැවති විනිමය අනුපාතය අනුව පසුව ලබා ගත හැකි ය.

## 05. සංග්‍රහ දීමනා

නිල චාරිකාවකදී දූත පිරිසට නායකත්වය දෙන අමාත්‍යවරයාගේ හෝ අමාත්‍යාංශ ලේකම්වරයාගේ ඉල්ලීම පරිදි ඇ.එ.ජ. ඩොලර් 750 ක් දක්වා වූ මුදලක් සංග්‍රහ දීමනා වශයෙන් ගෙවිය හැකි ය.

## 06. ප්‍රතිපූරණය කළ හැකි වියදම්

රාජකාරි විදේශ ගමන් සඳහා පිටත් වී යාමට පෙර විදේශගත වන නිලධාරියා විසින් මෙරට දී දරනු ලබන පහත සඳහන් වියදම් රජය මඟින් ප්‍රතිපූරණය කළ හැකි ය.

(අ) රාජකාරි විදේශ ගමන් සඳහා වන ගමන් බලපත්‍ර ගාස්තු සහ වීසා ගාස්තු

(1) වීසා ගාස්තු - රාජකාරි විදේශ ගමන් සඳහා විදේශ රජය හෝ ආයතනය විසින් වීසා ගාස්තු නොගෙවන අවස්ථාවකදී පමණක් නිලධාරියා විසින් දරන වීසා ගාස්තු ප්‍රතිපූරණය කිරීම කළ හැකි ය.

(2) ගමන් බලපත්‍ර ගාස්තු - අලුත් කිරීම් ද ඇතුළුව රාජකාරි විදේශ ගමන් වෙනුවෙන් නිලධාරියාගේ ගමන් බලපත්‍රය ලබාගැනීම සඳහා දරන වියදම ප්‍රතිපූරණය කිරීම කළ හැකි ය. මෙහි දී එක් දින සේවාව මඟින් ගමන් බලපත්‍ර ලබාගන්නා අවස්ථාවකදී, ගමන් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ගෙවන සාමාන්‍ය ගාස්තුව පමණක් ප්‍රතිපූරණය කළ හැකි ය.

(ආ) රක්ෂණ ගාස්තු

නිලධාරියෙකු ඉහත 03 ඡේදයෙහි සඳහන් රාජකාරි කටයුත්තක් සඳහා විදේශගතවීමේදී විදේශ රජය හෝ ප්‍රදායක ආයතනය විසින් විදේශගත වන කාලසීමාව වෙනුවෙන් රක්ෂණ ආවරණයක් ලබා නොදෙන අවස්ථාවලදී විදේශගත වන නිලධාරියාට රක්ෂණ සීමාව රු. 2,400,000/- නොඉක්මවන රක්ෂණ ආවරණයක් තම ආයතන ප්‍රධානියා මඟින් ලබා ගත හැකි ය.

## 07. ගිණුම් ගත කිරීම

(අ) විදේශ ගතවීමකදී ඉහත 03, 04, 05 හා 06 ඡේද යටතේ වන කිසියම් දීමනාවක් හෝ වියදම් ප්‍රතිපූරණය කිරීම සඳහා ඉල්ලුම් කිරීමේදී, එයට සම්බන්ධ අනුමැතිය හා දීමනාව/වියදම් ගණනය කිරීමට පදනම් වන ගුවන් ගමන් විස්තරය සහ අදාළ වන්නා වූ සියළුම ලේඛන ඉදිරිපත් කළ යුතු අතර ඒ අනුව ගණනය කරන දීමනා ගෙවීම් කරනු ලබන අවස්ථාවේදී එය වියදමක් වශයෙන් ගිණුම්ගත කළ යුතු ය.

(ආ) කිසියම් නිලධාරියකු ලබාගත් දීමනාවලින් හිමිකම් නොලබන මුදල් වේ නම් දිවයිනට ආපසු පැමිණි දින පැවති විනිමය අනුපාතය අනුව මාසයක් ඇතුළත පියවිය යුතු ය.

08. මෙම විෂයය සම්බන්ධයෙන් නිකුත් කර ඇති 1996.04.20 දිනැති අංක M.F6/1/1/96 දරණ චක්‍රලේඛය සහ එයට සංශෝධන ලෙස නිකුත් කර ඇති චක්‍රලේඛ හා 2010.10.11 දිනැති අංක මු.ක්‍ර.අ. 01/2010/01 දරණ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයීය චක්‍රලේඛය මෙයින් අවලංගු කරනු ලැබේ.

09. මෙම චක්‍රලේඛය පිළිබඳ පැහැදිලි කිරීමක් අවශ්‍ය වේ නම් දුරකථන අංක 011- 2484535 මඟින් මෙම අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී විමසිය හැකි ය.

ආර්.එච්.එස්. සමරතුංග
මුදල් අමාත්‍යාංශයේ ලේකම් සහ භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත්: 01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩල ලේකම්
04. විගණකාධිපති

උපලේඛන 01 - රටවල් කාණ්ඩ

| කාණ්ඩ අංක | රටවල නම් | | | | |
|---|---|---|---|---|---|
| 1 | ඇෆ්ගනිස්ථානය<br>ඇල්බේනියාව<br>ඇල්ජීරියාව<br>අසර්බයිජාන්<br>බහමාස්<br>බෙලරුස්<br>බාබඩෝස්<br>බෙලීස්<br>භූතානය<br>බොලිවියාව<br>බොස්නියා<br>බොස්ට්වානා | බුරුන්ඩි<br>කාම්බෝජය<br>කැනරි දූපත්<br>කේප්වර්ඩ්<br>කුක්ස් දූපත්<br>ඩොමිනිකාව<br>එල්-සැල්වදෝරය<br>ඉතියෝපියාව<br>ඉක්වටෝරියල්<br>ගැබොන්<br>ගැම්බියාව<br>ජිබෝල්ටාව | ගුවාම්<br>කිරිබටි<br>ලාඕසය මහජන ප්‍රජා.ජනරජය<br>ලෙසෝතියාව<br>ලිම්ටෙන්ස්ටින්<br>මැසිඩෝනියා ජනරජය<br>මලාවි<br>මෝල්ටාව<br>මෞරිටේනියා<br>මොංගෝලියා<br>මොන්ටෙග්‍රෝ<br>මියැන්මාරය | නැමිබියා<br>නාවුරු<br>නෙදර්ලන්ත දිවයින්<br>නිකරගුවා<br>පලාවු<br>පැරගුවේ<br>සැමෝවා<br>සමටූමා සහ ප්‍රින්ස්<br>සර්බියා<br>සියරාලියෝන්<br>සොලමන් දූපත්<br>සෝමාලියාව | වැන්සාතියා<br>ස්වාසිලන්තය<br>ටජිකිස්ථානය<br>ටියුනීසියා<br>උගන්ඩා<br>උස්බෙකිස්ථානය |
| 2 | ඇන්ටිගුවා-බර්බුඩා<br>ආමේනියාව<br>ආජන්ටිනාව<br>බල්ගේරියාව<br>බංග්ලාදේශය<br>බෘනෙයි<br>කැමරූන්<br>කෝට්ඩ් ඉවෝය<br>කොස්ටාරිකාව | ඉක්වදෝරය<br>ෆිජි<br>ප්‍රංශ ගුයානාව<br>ගුයානා<br>ග්‍රෙනඩාව<br>ජෝර්ජියා<br>ගෝතමාලා<br>ග්‍රීන්ලන්තය | ගිනිබිසව්<br>ගවාසි<br>හයිටි<br>හොන්ඩුරාස්<br>අයර්ලන්තය<br>ඉරානය<br>ජැමෙයිකාව<br>කොරියානු ප්‍රජා. ජන. | ලයිබීරියාව<br>මෙක්සිකෝව<br>මයික්‍රොනීසියා ජන.<br>මොනැකෝ<br>මොසැම්බික්<br>පැපුවානිව්ගිනියා<br>සුරිනාමය<br>යේමන් ජනරජය | යුගෝස්ලාවියාව<br>ටහිටි<br>ටොංගා<br>ටුවාලු |
| 3 | බහරේන්<br>චිලී<br>සයිප්‍රසය<br>ඊජිප්තු අරාබි ජන.<br>එස්ටෝනියාව<br>ඝානාව<br>හංගේරියාව<br>ඉන්දුනීසියාව<br>ඉරාන මුස්ලිම් ජන.<br>කෙන්යාව | කුවේට්<br>ලිතුවේනියාව<br>මැඩගස්කරය<br>මයුරිටියුස්<br>මැලේසියාව<br>මාලදිවයින<br>මොරොක්කෝව<br>මැසඩෝනියා ජන.<br>නේපාලය<br>ඕමානය | පකිස්ථානය<br>පැනමා<br>පීරු<br>පිලිපීනය<br>පෝලන්තය<br>කටාර්<br>රුමේනියාව<br>රුවන්ඩා<br>සවුදි අරාබිය<br>ස්ලෝවේනියාව | සිරියානු අරාබි ජන.<br>දකුණු අප්‍රිකාව<br>ශාන්ත ලුසියා<br>සූඩානය<br>තායිලන්තය<br>ටෝගෝ<br>ට්‍රිනිඩෑඩ් ටුබැගෝ<br>උරුගුවේ<br>වෙනිසියුලාව<br>සයිපැර් | වියට්නාමය<br>සැම්බියාව<br>සිම්බාබ්වේ<br>යුක්රේනය |
| 4 | බෙල්ජියම<br>බෙනින්<br>බර්කිනාෆාසෝ<br>කැමරූස්<br>මධ්‍යම අප්‍රිකානු ජන.<br>කොලොම්බියාව<br>කොංගෝව | ක්‍රොඒෂියාව<br>කියුබාව<br>චෙක් සමූහාණ්ඩුව<br>කොංගෝ ප්‍රජා.ජන.<br>ඩිජිබූටි<br>ග්‍රීසිය<br>අයිස්ලන්තය | ඉතාලියාව<br>අයිවරි කෝස්ට්<br>ජෝර්දානය<br>කසකස්ථානය<br>ලැට්වියා<br>ලෙබනනය<br>ලක්සෙම්බර්ග් | මාලි<br>නව කැලිඩෝනියාව<br>නයිජීරියා<br>පෘතුගාලය<br>ස්ලෝවැක් ජනරජය<br>ස්පාඤ්ඤය<br>තායිවානය | තුර්කිය<br>එක්සත් අරාබි ජන. |
| 5 | ඇන්ගෝලාව<br>ඔස්ට්‍රේලියාව<br>ඔස්ට්‍රියා<br>බ්‍රසීලය<br>කැනඩාව<br>චැඩ් | චීනය (බීජිං)<br>ඩෙන්මාර්කය<br>ප්‍රංශය<br>ජර්මනිය<br>ෆින්ලන්තය<br>හොංකොං | ඊශ්‍රායලය<br>ඉතාලිය<br>ජපානය<br>ලිබියාව<br>නෙදර්ලන්තය<br>නවසීලන්තය | නයිගර්<br>නෝර්වේ<br>රුසියාව<br>සෙනිගල්<br>ස්වීඩනය<br>සීෂෙල්ස් | සිංගප්පූරුව<br>දකුණු කොරියාව<br>ස්විට්සර්ලන්තය<br>එක්සත් රාජධානිය<br>එක්සත් ජනපදය |